(ii) අඩු වරප්‍රසාදලාභී හා රැකියා විරහිත පුද්ගලයන්හට සහය වීම හා අවස්ථාවන් ලබා දීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(iii) දිළිඳු පවුල් සඳහා අවශ්‍ය ඉඩම්, නිවාස හා පාසල් අධ්‍යාපන අවස්ථාවන් සහ පහසුකම් ලබාදීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(iv) යටිතල පහසුකම් අවශ්‍ය පාසල් සඳහා ඉඩම් සහ ගොඩනැගිලි පහසුකම් ලබාදීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(v) ස්වාභාවික විපත්වලට ලක් වූවන්ට සහනාධාර සැපයීම මගින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(vi) ආබාධිත සහ අනාථ අසරණ දරුවන් ඇතුළුව අවශ්‍යතාවයෙන් පෙළෙන ළමුන් හට ආදරය, රැකවරණය, අධ්‍යාපනය ලබාදීමට උපකාරීවන පාසල්, ළමා නිවාස සහ වෙනත් සංවිධාන පිහිටුවීම හා පවත්වාගෙන යාම මගින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(vii) අඩු වරප්‍රසාදලාභී හා අවශ්‍යතාවයන් ඇති පුද්ගලයන්හට නොමිලේ වෛද්‍ය කඳවුරු, වෛද්‍ය සායන පැවැත්වීම හා නොමිලේ බෙහෙත් ද්‍රව්‍ය බෙද හැරීම තුළින් අදාළ ආයතනවලට සහය දැක්වීම;

(viii) පදනමෙහි පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීමේ අදහසින් ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු සහ වෙනත් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම හා එවැනි පොත්, සඟරා පත්‍රිකා හා පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශ කිරීම සහ බෙද හැරීම; සහ

(ix) ඉහත කී පරමාර්ථ සියල්ලම හෝ එක් පරමාර්ථයක් සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකිවන එවැනි අනෙක් සියලුම ක්‍රියාවන් සිදු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානයන්ට යටත්ව චංචල හෝ නිශ්චල දේපළ අත්පත්කර ගැනීමේ සහ රඳවා ගැනීමේ, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ

